## 2.4 ජේ.ආර්. ජයවර්ධන විදේශ ප්‍රතිපත්තියේ නොබැඳි බව පිලිබඳ විමර්ශනයක්

ප්‍රියන්ත මුදලිගේ
ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSRACT

ජාත්‍යන්තර ප්‍රජාව සම්බන්ධයෙන් රාජ්‍යයක් විසින් අනුගමනය කරනු ලබන ක්‍රියාපිළිවෙත විදේශ ප්‍රතිපත්තියෙන් පිළිබිඹුවේ. සංවර්ධනය වන රටක් වශයෙන් ශ්‍රී ලංකාවටද විදේශ ප්‍රතිපත්ති උපාය මාර්ග ඉතා වැදගත්වේ. එයට හේතුව ආර්ථික හා දේශපාලනික ක්‍රියාකාරිත්වය කෙරෙහි විදේශ ප්‍රතිපත්තිය ඍජු ලෙස බලපෑමයි.

මෙම අධ්‍යයනය සඳහා ජේ.ආර්. ජයවර්ධනයන්ට පෙර යුගයේදී රාජ්‍ය නායකයන් විසින් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තීන් සංසන්දනාත්මක ලෙස විශ්ලේෂණය කර ඇත. ඒ සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත සහ තොරතුරු භාවිතයට ගන්නා ලදී.

ජයවර්ධන පාලන යුගයේදී ඔහු විසින් අනුගමනය කළ විදේෂ ප්‍රතිපත්තියෙහි නොබැඳිබවේ මූලධර්මය අනුගමනය කර ඇත්ද යන්න සළකා බැලීම පර්යේෂණයේ මූලික අරමුණු විය.

ජේ.ආර්. ජයවර්ධනයන් විසින් තම විදේශ සම්බන්ධතා පවත්වා ගෙන යාමේදී දේශපාලනික කරුණුවලට වඩා ආර්ථික සම්බන්ධතා වලට මූලිකත්වය දී කටයුතු කරන ලදී. ඔහු ධනවාදී හා සමාජවාදී යන කඳවුරු දෙකටම අයත් රටවල් සමග සම්බන්ධතා පවත්වාගෙන යන්නට විය. ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය සාර්ථක කර ගැනීම පිලිබඳව ජයවර්ධනයන් වැඩි සැලකිල්ලක් දැක්වූ බව පෙනේ. එම යුගයේදී ඔහුට වැඩි සහයෝගිතාවයක් ලබා දුන්නේ ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය ඇතුළු ධනවාදි කඳවුරට අයත් රටවල් විසිනි.

ජයවර්ධනයන් න්‍යායාත්මක ලෙස නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද නමුදු, ප්‍රායොගිකව ඔහු නොබැඳි පිළිවෙත, කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේ නැත. එයට හේතුව ආර්ථික කරුණු වලට මූලිකත්වය දී කටයුතු කිරීමයි. එහිදී කැපී පෙනෙනුයේ බටහිර පිළිවෙතක් අනුගමනය කළ බවයි.

ප්‍රධාන වචන : නොබැඳිබව
විදේශ ප්‍රතිපත්තිය